යම් කිසි වරදක් සම්බන්ධයෙන් කාන්තාවන් සහ පිරිමින් යන දෙපාර්ශවයේම අය අත්අඩංගුවට ගත් අවස්ථාවකදී වුවද, කාන්තා පාර්ශවය එහිදී ඉස්මතු කොට දැක්වීමේ ප්‍රවණතාවයක් ඇතැම් පුවත් වාර්තාවන් තුළ දක්නට ලැබේ. "මහරගම බූරු පොළකින් කාන්තාවෝ තිදෙනෙක් ඇතුළු 7ක් කොටු වෙති" (මව්බිම, පෙබරවාරි 08, 2022), "දරුවා උකුලේ තියාගෙන මව සූදු කෙළලා, කතුන් 3 ක් ඇතුළු 7 ක් දැලේ" (ලංකාදීප පෙබරවාරි 08, 2022) වැනි සිරස්තල හා උපසිරස්තල ඊට උදාහරණ වේ.

ඔබ සිතන ලෙසට,

1) මෙවැනි සිදුවීම් වාර්තා කිරීමේදී කාන්තා පාර්ශවය පමණක් ඉස්මතු කොට දැක්වෙන්නේ, කාන්තාවන් හා පිරිමින් සම්බන්ධ වන එකම වරදක් වුවත්, කාන්තාවක් අතින් සිදුවීමේදී ඊට වැඩි බරක් තිබෙනා බවක් පෙන්වීමට ද?

2) එසේ නම්, මෙවැනි කාන්තාවන් ඉස්මතු කොට දැක්වෙන භාෂා භාවිතයක් ඔස්සේ, ස්ත්‍රී පුරුෂ භාවද පදනම් කරගනිමින් කාන්තාව කොන් කිරීමක් සිදු නොවන්නේ ද?